මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
மஹபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்
MAHAPOLA HIGHER EDUCATION SCHOLARSHIP TRUST FUND

4 වන මහල, ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය, 191, ධර්මපාල මාවත, කොළඹ 07, ශ්‍රී ලංකා
4ஆம் மாடி,ஜே.ஆர்ஜயவர்தன நிலையம்,191,தர்மபால மாவத்தை,கொழும்பு 07
4TH Floor, J.R. Jayawardene centre, 191, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka


මගේ අංකය / எனது இல / My No. MTF/1/1/I (2018 / 2019) | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2020

ගරු ස්වාමීන් වහන්ස/මහත්මයාණෙනි/මෙනවියනි,

## මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය - 2018 / 2019

01. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි කුසලතා/සාමාන්‍ය ශිෂ්‍යත්වයක් පිරිනැමීමට ඔබ තෝරාගෙන ඇති බව සතුටින් දන්වමි.

02.

(i) ඔබට මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කෙරෙනුයේ ඔබගේ උසස් අධ්‍යාපන කටයුතු ආර්ථික අසීරුතාවයකින් තොරව අඛණ්ඩව හා අනලස්ව කර ගෙන යාමට සඵල පිටුබලයක් සැපයීමේ උතුම් පරමාර්ථයෙනි. ඒ අනුව ඔබ තෝරාගෙන ඇති පාඨමාලාව සඳහා නියමිත අධ්‍යයන කාලසීමාව තුල පාඨමාලාව පැවැත්වෙන කාලයේදී කුසලතා ශිෂ්‍යත්වලාභියෙකුට මසකට රු 5,050/- ක් බැගින්ද සාමාන්‍ය ශිෂ්‍යත්වලාභියෙකුට මසකට රු 5,000/- ක් බැගින්ද එක් අධ්‍යයන වර්ෂයකදී වාරික 10 ක උපරිමයකට යටත්ව ඔබ අයත් විශ්ව විද්‍යාලයේ නිර්දේශය පරිදි, මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල මගින් සෘජුවම ඔබගේ බැංකු ගිණුම වෙත මුදල් බැර කරනු ලැබේ. එසේ මුදල් බැර කළ බවට කෙටි පණිවිඩයක් මඟින් ඔබව දැනුවත් කරනු ඇත. ( ඔබගේ බැංකු ගිණුම් පිළිබඳ විස්තර ලබා ගැනීමට ඇමුණුම් අංක 02 සම්පූර්ණ කලයුතු වේ.)

(ii) **රැකියාවක නිරතවීම නිසා හෝ ඔබගේ කැමැත්ත මත හෝ වෙනත් ඕනෑම හේතුවක් නිසා හෝ ඕනෑම අවස්ථාවක ඔබගේ ශිෂ්‍යත්වය නතර කිරීමට ඔබට ඉල්ලා සිටිය හැකිය.**

03. මෙම ශිෂ්‍යත්ව ප්‍රදානයට අදාල කොන්දේසි මාලාව මෙයට යා කර ඇත. එම කොන්දේසි සුපරීක්ෂාකාරීව කියවනු මැනවි. ඔබ ශිෂ්‍යත්වය භාර ගැනීමෙන් පසුව එම කොන්දේසිවලට යටත්වනු ඇත.

04. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අධ්‍යක්ෂ සහ විශ්වවිද්‍යාල බලධාරීන් විසින් ඔබගේ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් මතුවට පනවනු ලබන කොන්දේසි හා රෙගුලාසිවලට ද ඔබ යටත්වනු ඇත.

05. **ඔබගේ විශ්වවිද්‍යාලය, පීඨය , ලියාපදිංචි අංකය ආදියෙහි මතු සිදුවන වෙනස්කම් අප්‍රමාදව විශ්ව විද්‍යාලය වෙත දැන්විය යුතුය. විශ්වවිද්‍යාලය හෝ පාඨමාලාව මාරුවීමකදී ඒ බව නොදැන්වීමෙන් මාරුවී පැමිණි ස්ථානයේදී ශිෂ්‍යත්ව වාරික මුදල් ලබා ගැනීමට නොහැකිවනු ඇත.** ඔබගේ ශිෂ්‍යත්ව ප්‍රදාන අංකය ඉදිරි ලිපි ගනුදෙනුවලදී සඳහන් කල යුතුය. ඔබගේ අධ්‍යාපන කටයුතු ආරම්භ කල පසුව සියලු ලිපි ගනුදෙනු ඔබගේ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී මඟින් සිදුවිය යුතුය.

06. මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයේ සම්ප්‍රදාය අනුව, එයට හිමිකම් ලැබීම සඳහා **ඔබ විසින් පෞද්ගලිකව ශිෂ්‍යත්වය භාරගත යුතුය. එසේ නොවුවහොත් ඔබගේ ශිෂ්‍යත්වය අවලංගු වනවා ඇත.**

07. ඔබගේ අධ්‍යාපන කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

මෙයට - විශ්වාසී වූ,

**එම්.පරාක්‍රම බණ්ඩාර,**
අධ්‍යක්ෂ,
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල


දුරකථන/ தொலைபேசு / Tel: 0112685011, ෆැක්ස්/ பெக்ஸ் / Fax: 0112675524 Web : www.mahapola.lk Email : mahapola@mahapola.lk



1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත යටතේ ස්ථාපිතයි. மஹாபொல உயர்கல்வி புலமைப்பாசில் நம்பிக்கை நிதியமானது 1981 ஆம் ஆண்டின் 66 ஆம் இலக்க சட்டத்தினால் தபிக்கப்பட்டதாகும் Established under Mahapola Higher Education Scholarship Trust Fund Act No.66 of 1981